# ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

## රැකියා පුරප්පාඩු

**ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් අයදුම් කරුවන්ගෙන් 2020.11.06 දක්වා අයදුම්පත් බාරගනු ලැබේ.**

❖ **<u>ව්‍යාපෘති කාර්යාලය</u>**

**(1) ව්‍යාපෘති කළමනාකරු - ඉදිකිරීම් වැඩ**

❖ **<u>ශිෂ්‍ය සහ කාර්යමණ්ඩල සුබසාධක අංශය</u>**

**(2) වෛද්‍ය නිලධාරී**

**(3) ගොවිපල කළමනාකරු,III ශ්‍රේණිය**

**(4) විනයාරක්ෂක නිලධාරී (Marshal),II ශ්‍රේණිය**

**(5) උප පාලක (Sub Warden), II ශ්‍රේණිය (පූර්ණ කාලීන)**

**(6) ඖෂධවේදී (පහළ ශ්‍රේණිය)**

**(7) මහජන සෞඛ්‍ය පරීක්ෂක, III ශ්‍රේණිය**

**<u>වැටුප් පරිමාණ:</u>**

| | | |
|---|---|---|
| ව්‍යාපෘති කළමනාකරු | : | U-EX 2(II) - Rs. 66,180 - 8X1,335; 8X1,630 - 89,900 p.m. |
| වෛද්‍ය නිලධාරී | : | U-MO 1(II) - Rs. 55,350 - 10X1,335; 1X1,630 - 70,330 p.m. |
| ගොවිපල කළමනාකරු, III ශ්‍රේණිය | : | U-EX 1 (II) Rs. 50,625- 3X1,125 - 54,000(EB) 55,335; 12X1,335-71,355p.m. |
| විනයාරක්ෂක නිලධාරී (Marshal), II ශ්‍රේණිය | : | U-MN 3 (II) - Rs. 42,885 - 18X660 - 54,765 p.m. |
| උප පාලක, II (පූර්ණ කාලීන) | : | U-MN 3 (II) - Rs. 42,885 - 18X660 - 54,765 p.m. |
| ඖෂධවේදී (පහළ ශ්‍රේණිය) | : | U-MT 1(IIIA) - Rs. 31,625 - 7X300; 10X355 - 37,275 p.m. |
| මහජන සෞඛ්‍ය පරීක්ෂක, III ශ්‍රේණිය | : | U-MT 1(IIIA) - Rs. 31,625 - 7X300; 10X355 - 37,275 p.m. |

**(ඉහත සඳහන් වැටුපට අමතරව විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.).**

**<u>ප්‍රතිලාභ</u>**

- තෝරාගත් අයදුම්කරුවන්ගේ මාසික වැටුපෙන් 10% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරන අතර, විශ්වවිද්‍යාලය විසින් 15% ක දායකත්වයක්, වැටුපෙන් 8% ක කොටසක් විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදලට සහ 7% ක කොටසක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ලෙස දායකත්වය කරනු ලැබේ. තවද ඔවුන් සේවක භාරකාර අරමුදලේ සාමාජිකත්වය දරණ අතර, ඒ සඳහා විශ්වවිද්‍යාලය විසින් මාසික වැටුපෙන් 3% ක කොටසක් සේවක භාරකාර අරමුදල වෙනුවෙන් දායකත්වයක් දරනු ලැබේ.
- ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරීන් වසර 07 ක සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසු වසරක් සඳහා වැටුප් සහිතව හෝ වසර දෙකක වැටුප් රහිත සප්ත වාර්ෂික නිවාඩු (sabbatical leaves) සඳහා සුදුසුකම් ලබයි. සප්ත වාර්ෂික නිවාඩු මත විදේශ ගත වීමේ දි එම නිලධාරියාට සහ කලත්‍රයාට ගුවන් ටිකට් පත් සඳහා වැය වූ මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමේ හැකියාව ලැබේ.

**<u>අයදුම්පත් සහ විස්තර</u>**

අයදුම්පත් , අවශ්‍ය සුදුසුකම් සහ අනෙකුත් විස්තර www.seu.ac.lk යන විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් ලබා ගත හැක. උනන්දුවක් දක්වන අයදුම්කරුවන් අයදුම්පතක් සඳහා රු. 200 මුදලක් ගෙවීමෙන් විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් බාගත කරගත හැක.

අයදුම්පත් ගාස්තු මහජන බැංකුවේ ඕනෑම ශාඛාවක් මගින් ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ නමට මහජන බැංකුවේ අඩ්ඩාලච්චේන ශාඛාවේ 228-1001-9000-1704 දරණ ගිණුම් අංකයට බැර වෙන පරිදි ගෙවීම් සිදු කළ යුතුය. එක තනතුරකට වඩා වැඩි ගණනකට අයදුම් කිරීමට අපේක්ෂා කරන අයදුම්කරුවන්, ඒ ඒ තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් එවිය යුතුය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහ සහතිකවල පිටපත් ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල උද්‍යානය, ඔළුවිල් # 32360 යන ලිපිනයට 2020.11.06 දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් ලැබීමට සැලැස්විය යුතුය. ඉල්ලුම් කරන ලද තනතුරේ නම ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවකයින් වන අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් හරහා තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.නමුත් අයදුම්පතේ ප්‍රගමණ පිටපතක් (Advance Copy) අයදුම්කරුවන්ට මූලිකව එවීමේ හැකියාව ඇති අතර, අදාළ රාජ්‍ය ආයතනයේ ප්‍රධානියා හරහා අයදුම්පත් ඉදිරිපත්කර නොමැති නම්, එවැනි අයදුම්කරුවෙකු පත්වීම සඳහා සලකා බලනු නොලැබේ.

අපේක්ෂකයින් තෝරා ගැනීමේ අවසන් කෙටි ලේඛනය සකස් කිරීමේ අයිතිය ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය සතු වන අතර, සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන්නේ කෙටි ලේඛනයේ ලැයිස්තුගත අයදුම්කරුවන් පමණි.

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය,**
**විශ්වවිද්‍යාල උද්‍යානය, ඔළුවිල් # 32360.**
07.10.2020